# ප්‍රසම්පාදන දැන්වීම.

## සෞඛ්‍ය අමාත්‍යාංශය - ශික්ෂණ රෝහල කුරුණෑගල.

1.කුරුණෑගල ශික්ෂණ රෝහලේ පහත උපලේඛනයේ දක්වා ඇති වැඩ විෂයයන් සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසුපත් කැඳවනු ලැබේ.

02. ලංසු ලිපිලේඛණ **2023.01. 24** දින සිට **2023.02.14**. දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවල පෙ.ව. **9.00** - ප.ව. **3.00** අතර කාලය තුලදී කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. ලංසු ලිපිලේඛණ ලබාගැනීම සඳහා ව්‍යාපාර ලියාපදිංචිය සහ සුදුසුකම් සනාථ කෙරෙන සාක්ෂි සහ ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රධාන ගණකාධිකාරී වෙත මුදලින් ගෙවීමෙන් පසු ලබාගත් පොදු **172** ආකෘතියේ ලදුපත ඉදිරිපත් කළ යුතුය.

3.පිටපත් 02 කින් යුතුව නිවැරදිව සම්පූර්ණ කරන ලද ලංසුපත් ලේඛන ඒවායේ සඳහන් ලංසු ඇපකරද සමඟ **2023.02.15** දින **පෙ.ව.10.00** ට පෙර ලැබෙනසේ **"සභාපති ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව ශික්ෂණ රෝහල කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිය. එසේ නැතහොත් රෝහලේ ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහා ලිය හැක. ලංසුපත් බහාලන කවරයේ ඉහල වම්කෙළවරේ ඉල්ලුම් කරන වැඩ විෂයය සඳහන් කරන්න.

4.මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණයවේ.

5. ඉහත වැඩ විෂයයන් සම්බන්දයෙන් පූර්ව ප්‍රසම්පාදන සාකච්ඡාවක් **2023.02.02** දින අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වේ.

6.පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද සහතිකය(**PCA3**) ( ලංසු ලේඛණ නිකුත් කිරීම සඳහා පමණක් සහතිකය සඳහා ගෙවීම් සිදුකල ලදු පත පිළිගනු ලැබේ.)

7.මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කිසියම් වෙනසක් හෝ සංශෝධනයක් වේ නම් එය **www.Kurunegalahospital.healthgov.lk** රෝහලේ වෙබ් අඩවියේ පළ කෙරේ.

| විෂයය අංකය | වැඩ විස්තරය | සුදුසුකම්/පළපුරුද්ද | ආපසු ගෙවන ලංසු ඇපකර ගාස්තු රු. | ආපසු නොගෙවන ලංසු අයදුම්පත් ගාස්තුව රු. |
|---|---|---|---|---|
| 01. | 2023 වර්ෂය සඳහා විශේෂිත ඒකකවල වායුසමණ යන්ත්‍ර **42** ක් සේවා හා නඩත්තු කිරිම | CIDA (EM04) වලංගු ලියාපදිංචිය, සේවා ඉටු කිරීම සම්බන්ධයෙන් වසර 03 ක පලපුරුද්දක් තිබීම. ඉන් වසර 01ක් රජයේ රෝහලක සේවයවීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. | රු.20,000.00 | රු.2,000.00 |
| 02 | 2023 වර්ෂය සඳහා රෝහලේ වාට්ටු සහ විවිධ ඒකකවල සවිකර ඇති වායුසමණ යන්ත්‍ර **606** ක් සේවා හා නඩත්තු කිරිම. | CIDA (EM04) වලංගු ලියාපදිංචිය, සේවා ඉටු කිරීම සම්බන්ධයෙන් වසර 03 ක පලපුරුද්දක් තිබීම. ඉන් වසර 01ක් රජයේ රෝහලක සේවයවීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. | රු.50,000.00 | රු.2,000.00 |

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව
ශික්ෂණ රෝහල
කුරුණෑගල.

දුරකථන අංකය 037 2233906-09 (දිගුව2800)